**2021 තෙවන වාර පරීක්ෂණය** **7 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය 1 පත්‍රය** කාලය විනාඩි 30යි.

*එක් එක් ප්‍රශ්නයට අදාළව වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1).බුදු රජාණන් වහන්සේ සම්බුද්ධත්වයට පත්වීමෙන් පසු ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඇසුරු කරමින් ගත කළ සත් සතිය තුළ සිව්වන සතියේ සිදු වූ අසිරිමත් සිදුවීම කුමක් ද?

1. යමක මහා ප්‍රාතිහාර්ය පෑම 2. සක්මන් කිරීම
3. අභිධර්මය මෙනෙහි කිරීම 4. සමාපත්ති සුවයෙන් වැඩ සිටීම

(2).බුදු රජාණන් වහන්සේ ,රහසින් වත් පව් නොකළ හෙයින්ද,සියලු කෙලෙස් දුරු කළ හෙයින් ද, සියලු පූජාවන්ට සුදුසු වන හෙයින්ද ,

1. සුගත නම් වන සේක 2. අරහං නම් වන සේක
3. ලෝකවිදූ නම් වන සේක 4. සම්මා සම්බුද්ධ නම් වන සේක

(3).සිරිත් විරිත් පැහැදිලි කරමින් තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කළ ග්‍රන්ථය වන්නේ,

1. ලෝවැඩ සඟරාව 2. සිරිත් මල්දම
3. සුභාෂිතය 4. කාව්‍යශේඛරය

(4).පන්සලට ගොස් වන්දනා කරන අනු පිළිවෙළ වන්නේ,

1. බුදු පිළිමය,චෛත්‍ය,බෝධිය, 2. බෝධිය,බුදු පිළිමය,චෛත්‍යය
3. චෛත්‍යය,බුදු පිළිමය,බෝධිය 4. චෛත්‍යය,බෝධිය,බුදු පිළිමය

(5).බුදු සසුනේ අග්‍ර දයකයා හා දයිකාව විසින් බුදු රදුන්ට පූජා කළ ආරාම දෙක වන්නේ

1. වේළුවනාරාමය, ජේතවනාරාමය 2. ජේතවනාරාමය, නිග්‍රෝධාරාමය
3. නිග්‍රෝධාරමය, වේළුවනාරාමය 4. වේළුවනාරාමය, පූර්වාරාමය

(6).සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ධම්ම පදයේ ගාථා ගණන වන්නේ

1. 432 කි 2. 540 කි 3. 423 කි 4. 324 කි

(7).බුදු දහමට අනුව අකුසලයෙන් වෙන්වීම හා කුසලයෙහි නිරතවීම හඳුන්වන්නේ

1. සීලය හා විරතිය 2. සමාධිය හා සමාදානය
3. සමාදනය හා සීලය 4. විරතිය හා සමාදනය

(8). නායකත්වය පිළිබඳ සඳහන් ජාතක කතාවකි.

1. අපණ්ණක ජාතකය 2. වෙස්සන්තර ජාතකය

3. මාතුපෝෂක ජාතකය　　　　　　　　4. ස්වර්ණහංස ජාතකය

(9).ලක්දිවට මිහිඳු හිමියන් වැඩම වීම නිසා ලැබුණු උතුම් ම දායාදය වන්නේ

1. චිත්‍ර කලාව　　　　　　　　2. ත්‍රිවිධ රත්නය

3. ගෘහ නිර්මාණ ශිල්පය　　　　　　　　4. ලේඛන කලාව

(10).උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග පහකි.ඊට අයත් නොවන්නේ,

1. මළ මුත්‍ර ආදියට පිළිකුල් නොවීම.
2. රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීම.
3. ලාභ අපේක්ෂාවෙන් තොරව කරුණාවෙන් කටයුතු කිරීම.
4. රෝගියාගේ සිත සැනසෙන කතා පැවසීම.

*ප්‍රශ්න අංක 11 -16 දක්වා පහත ප්‍රකාශ හරි නම් (✓) වැරදි නම් (✕) ලකුණ ද යොදන්න.

11. සිරිත් මල්දම රචනා කළේ ඇම්.ඇල්.සිල්වා ගුරු මුහන්දිරම් තුමා ය.　(........)
12. බුදුදහම පටිසෝතගාමී ය.　(........)
13. යහළු මිත්‍රාදීන්ට ශිෂ්‍යයා හඳුන්වා දීම ගුරුවරයාගේ යුතුකමක් නොවේ.　(........)
14. උද්භිද විද්‍යාත්මක හේතු බීජ නියාමයට අයත් නොවේ.　(........)
15. තමා උපමා කොට අන් අයට හිංසා පීඩා කිරීමෙන් වැළකීම අත්තූපනායික ධර්ම පර්යාය වේ.　(........)

*ප්‍රශ්න අංක 16 -20 දක්වා ගැළපෙන පිළිතුරු යා කරන්න.

| අ කොටස | ආ කොටස |
| --- | --- |
| 16. අනේපිඬු සිටුතුමා | සලිකේදර ජාතකය |
| 17. මව් පියන්ට සැළකීම | සම්මා වායාම |
| 18. ධම්ම පදය | ජේතවනාරාමය |
| 19. අසරණයන්ට පිහිටවීම | ඛුද්දක නිකාය |
| 20. නිවැරදි යහපත් උත්සාහය | සෝපාක |

**බුද්ධ ධර්මය 2 පත්‍රය** කාලය පැ 1 වි 30 යි

(01).

1 .අනිමිස ලෝචන පූජාව යනු කුමක්ද?

2.බුදුරජාණන් වහන්සේ මහියංගණයට වැඩියේ කුමන පෝය දවසක ද?

3.මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංග දෙකක් නම් කරන්න.

4.පූර්වාරාමය පූජා කළේ කවුද?

5.ඉවසීමෙන් ලැබෙන ආනිශංසය දෙකක් ලියන්න.

6.අග්‍රශෂ්‍ය දනය යනු කුමක්ද?

7.විදේශීය ආක්‍රමණ වලදී ඒවාට විසඳුම් සෙවීමට නයකත්වය ගෙන ක්‍රියා කළ භික්ෂූන් වහන්සේ නමක් නම් කරන්න.

8., කම්ම විපාකජා ආබාධා, යනු කුමක්ද ?

9.තුන් ආකාර තෘෂ්ණාව යනු කුමක්ද ?

10. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා නම් කරන්න.

(2).

1.පන්සිල් පද හඳුන්වන වෙනත් නමක් ලියන්න.

2. පන්සිල් පද පිළිවෙළින් ලියන්න.

3. පන්සිල් ආරක්ෂා කිරීමෙන් සමාජයට වන යහපත කෙටියෙන් ලියන්න.

(3).

1. චතුරාර්ය සත්‍යයෙන් දෙකක් නම් කරන්න.

2. තෘෂ්ණාවේ කොටස් තුන නම් කරන්න.

3. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිවිධ ශික්ෂාවට බෙදා දක්වන්න.

(4).

1. මිහිඳු මහ රහතන් වහන්සේ ගේ පියා කවුද ?

2. මිහිඳු මහ රහතන් වහන්සේ සමග ලක්දිවට පැමිණි පිරිස නම් කරන්න.

3.බුදු දහම ප්‍රචාරය වීමෙන් පසු ලක්දිව ඇති වූ හෙළ කලා කෘති දෙකක් නම් කරන්න.

(5).

1. අනේකංගදස්සී යනු කුමක්ද?

2. නියාම ධර්ම පහෙන් දෙකක් නම් කරන්න.

3. ඉන් එකක් පැහැදිලි කරන්න.

(6). 1.භාවනා කිරීමේදී ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශවය හිඳ ගත යුතු ආකාරය ලියන්න.

2. ,මාතා යථා නියං පුත්තං ආයුසා ඒක පුත්ත මනුරක්ඛේ,යන ගාථාවේ ඉතිරි පද දෙක ලියන්න.

3. එහි තේරුම ලියන්න.

කේ.ඩී.අයි.මාලනි

ර/රංවල මහා විද්‍යාලය